**සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘති සංරචක - II - 2025**

-----------------------------------------------------------------

සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘති සංරචක - II 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යාන්තර සංවර්ධන සමායතනය අතර 2018 ජූලි 25 දින එළඹී අංක 6228 LK දරණ ණය ගිවිසුමේ 5.09 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

ණය ගිවිසුමට අනුව, අධ්‍යාපන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ.

සාමාන්‍ය අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සහ භාරකාරත්වය ශක්තිමත් කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ භාරකාරත්වය ශක්තිමත් කිරීම, ව්‍යාපෘති වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ තාක්ෂණික සහාය යන සංරචක දෙකක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ.

ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 449,645 කට සමාන වූ එ.ජ.ඩො මිලියන 2900 ක් වන අතර ඉන් රු. මිලියන 15,505කට සමාන වූ එ.ජ.ඩො මිලියන 100 ක් සැපයීම සඳහා ජාත්‍යාන්තර සංවර්ධන සමායතනය සමඟ එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු. මිලියන 434,140 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට බලාපොරොත්තු වේ. ව්‍යාපෘතියේ කටයුතු 2018 අගෝස්තු 30 දින ආරම්භ කරන ලද අතර, 2024 ජුනි 30 දින වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමේ දිනය 2027 ජුනි 30 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මතය

මූල්‍ය ප්‍රකාශන වලින් 2025 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය, වියදම් ප්‍රකාශය සහ එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශයයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී.

මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිත කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2019 මාර්තු 15 දිනැති මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ අංක 01/2018 දරන චක්‍ර ලේඛයේ | රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව අවම | එකඟයි. අදාළ කාලසීමාව තුළ මෙහෙයුම් කමිටු රැස්වීම නිසි පරිදි පැවැත්වීමට | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | 9.3 ඡේදය. | වශයෙන් මාස 02 කට වරක්වත් රැස්වී ඇති බවට සහතික වියයුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ මෙහෙයුම් කමිටු රැස්වීම් 2 ක් පමණක් පවත්වා තිබුණි. | අනාගතයේදී අවශ්‍ය කටයුතු සිදුකරනු ඇත. | |
| (ආ) | ව්‍යාපෘති ඇගයීම් ලේඛණයේ 96 ඡේදය. | අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය විසින් ව්‍යාපෘතියේ අභ්‍යන්තර විගණනය සිදුකළ යුතු වුවද, 2025 වර්ෂයේදී අභ්‍යන්තර විගණන සැලැස්ම තුළ සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය විගණනය සඳහා වෙනම ඒකකයක් ලෙස හඳුනාගෙන නොතිබුණි. එසේම 2021 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියේ විගණනයට අදාලව කිසිදු අභ්‍යන්තර විගණන වාර්තාවක් නිකුත් කර නොතිබුණි. | එකඟයි. සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සිදු කරන ලද අභ්‍යන්තර විගණන පරීක්ෂණයට අදාළ විගණන වාර්තාව නිකුත් කිරීමට මම බලාපොරොත්තු වෙමි. | ව්‍යාපෘති ඇගයීම් ලේඛනයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 මතභේදාත්මක ස්වරූපයේ කරුණු

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියේ විසර්ජන සබැඳි දර්ශක (DLI) දෙකක සම්බන්ධීකරණ කටයුතු සඳහා උපදේශකවරු දෙදෙනෙකු බඳවාගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂය සඳහා රු. 1,436,000ක් උපදේශක ගාස්තු ලෙස ගෙවා තිබුණි. | උපදේශකයින්ගේ ක්ෂේත්‍ර චාරිකාවලින් අනාවරණය වූ කරුණු, දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා නිතර යොදා ගැනු ඇත. | විසර්ජන සබැඳි දර්ශක (DLI) ළඟාකර ගැනීම සඳහා උපදේශකවරුන්ගේ වාර්තා තීරණ ගැනීමේ මෙවලමක් ලෙස |

| | | | |
|---|---|---|---|
| | ව්‍යාපෘතියේ විසර්ජන සබැඳි දර්ශකවල අරමුණු ඉටු කිරීමෙන් ලැබෙන ප්‍රතිඵල පාසල් පද්ධතියට ලබාදීම සඳහා තීරණ ගැනීමේ මෙවලමක් ලෙස මෙම උපදේශකවරුන්ගේ වාර්තා යොදාගතයුතු වුවත් එලෙස කටුයුතුකර නොතිබුණු අතර අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති හා සැලසුම් අංශය විසින් ප්‍රමාණවත් අධීක්ෂණයක්ද සිදුකර නොතිබුණි. | | භාවිතා කළ යුතු අතර, අදාළ සැලසුම් අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති සැලසුම් සහ කාර්යසාධන සමාලෝචන අංශය විසින් සකස් කර උපදේශකයින් මාර්ගයෙන් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය යටතේ, අධ්‍යාපන ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි හැදෑරීම සඳහා නිලධාරීන් පස් දෙනෙකුට විදේශ ශිෂ්‍යත්ව පිරිනමා තිබුණි. අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුවේ තීරණවල 05වන ඡේදයට අනුව මීට පෙර ශිෂ්‍යත්ව ලබා නොගත් නිලධාරීන්ට ප්‍රමුඛතාවය ලබා දිය යුතු බව සඳහන්කර තිබුණද වෙනත් විශ්ව විද්‍යාලවල පශ්චාත් උපාධි සම්පූර්ණ කරන ලද නිලධාරීන් ශිෂ්‍යත්ව වැඩසටහන සඳහා තෝරාගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, මෙතෙක් පශ්චාත් උපාධියක් ලබා නොතිබූ නිලධාරීන්ට විදේශ ශිෂ්‍යත්වයක් ලබා ගැනීමේ අවස්ථාව අහිමි වී තිබුණු අතර, අපේක්ෂිත අරමුණු ද ඉටුවී නොතිබුණි. | එකඟයි. අදාළ නිර්ණායක නිසි ලෙස අනුගමනය කරමින්, හැකි සෑම අවස්ථාවකදීම සාධාරණ ක්‍රමවේදයක් ඔස්සේ තෝරාගැනීම් සිදු කිරීමට පියවර ගනු ඇත. | විදේශ ශිෂ්‍යත්ව සඳහා නිලධාරීන් තෝරා ගැනීමේදී නිශ්චිත නිර්ණායක ස්ථාපිත කළ යුතු අතර, අදාළ නිර්ණායකවලට අනුකූලව නිලධාරීන් තෝරා ගත යුතුය. |
| (ඇ) | පශ්චාත් උපාධිය සම්පූර්ණ කරනලද කථිකාචාර්යවරුන් දෙදෙනෙක් අනිවාර්ය සේවා කාලය අවසන් වීමට පෙර සේවය අතහැර ගොස් තිබුණු අතර මෙම කථිකාචාර්යවරුන් දෙදෙනා සඳහා වැය වූ රු. 17,285,346ක මුදල අදාල නිලධාරිනියගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි. | ඔවුන්ගෙන් අය විය යුතු මුදල දින 14ක් ඇතුළත අය කර ගැනීමට පියවර ගන්නා ලෙස අදාළ අධ්‍යාපන විද්‍යාපීඨයේ පීඨාධිපතිවරයාට දැනුම් දීමට පියවර ගෙන ඇත. | විදේශ ශිෂ්‍යත්ව ප්‍රදානයට අදාළ සියලු කටයුතු අමාත්‍යාංශය විසින් සිදු කර ඇති බැවින්, අය විය යුතු මුදල් අය කර ගැනීමේ ක්‍රියාවලියද අමාත්‍යාංශය විසින්ම සිදු කළ යුතුය. |
| (ඇ) | එක් කථිකාචාර්යවරියක් පශ්චාත් උපාධිය අතරමඟ අතහැරදමා විදේශගතවී තිබුණු අතර මෙම උපාධි වැඩසටහන සඳහා වැය වූ රු. 6,073,940ක මුදල එම නිලධාරිනිය තනතුරෙන් ඉවත් වී වසර 03කට අධික කාලයක් ගතවී ඇතත් අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි. | අදාළ මුදල අය කර ගැනීමට පියවර ගන්නා ලෙස විදේශ ආයතන හා විදේශ කටයුතු අංශය විසින් අදාළ අධ්‍යාපන විද්‍යාපීඨයේ පීඨාධිපතිවරයා වෙත දැනුම් දී ඇත. | විදේශ ශිෂ්‍යත්ව ප්‍රදානයට අදාළ සියලු කටයුතු අමාත්‍යාංශය විසින් සිදු කර ඇති බැවින්, අය විය යුතු මුදල් අය කර ගැනීමේ ක්‍රියාවලියද අමාත්‍යාංශය විසින්ම සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ව්‍යාපෘති ඇගයීම් වාර්තාවේ (PAD) 52 වන ඡේදය ප්‍රකාරව ව්‍යාපෘති අරමුදල් නිදහස් කිරීමට පෙර අධ්‍යාපනික විශේෂඥතාවයක් ඇති ස්වාධීන පර්යේෂණ ආයතනයක් විසින් ප්‍රතිඵල සත්‍යාපනය කල යුතුය. ඒ අනුව ව්‍යාපෘති අරමුදල් උපයෝජනය මඟින් අදාල විසර්ජන සබැඳි දර්ශක ළඟාකර ගැනීම පිළිබඳ ස්වාධීන ඇගයීමක් කිරීම තෝරාගත් ආයතනයේ වගකීම වුවද එම ස්වාධීන වාර්තා සකස් කිරීම සඳහා අවශ්‍ය දත්ත අධ්‍යාපන අමාත්‍යාංශය විසින්ම ලබා දී තිබීම නිසා එම ආයතනය විසින් ලබාදෙන වාර්තාවල නිවැරදිභාවය පිළිබඳ විගණනයට ගැටළු සහගත විය. | මෙම තෙවන පාර්ශ්වීය තහවුරු කිරීමේ (TPV) කාර්යය SLAAED වෙත පැවරීමට ලෝක බැංකුව විසින් ලබා දී ඇති නිර්දේශයට අමතරව, මෙම ක්‍රියාකාරකම සම්බන්ධයෙන් ලෝක බැංකුවේ වෙනත් කිසිදු මැදිහත්වීමක් නොමැත. එබැවින්, අමාත්‍යාංශය විසින් SLAAED සමඟ සම්බන්ධීකරණය වී, ඔවුන්ගේ අධ්‍යයනය සිදු කිරීම සඳහා අවශ්‍ය දත්ත ඔවුන් වෙත ලබා දිය යුතුය. | තෙවන පාර්ශ්වීය ඇගයීම සඳහා තෝරාගනු ලබන ආයතනය විසින් අදාළ දත්ත තමන් විසින්ම ලබාගෙන, විසර්ජන සබැඳි දර්ශක (disbursement-linked indicators) සාක්ෂාත් කරගැනීම පිළිබඳ ස්වාධීන ඇගයීමක් සිදු කළ යුතුය. |